# අභ්‍යාසලාභී පෙර පාසල් ගුරු සහායකවරු (කාන්තා) බඳවා ගැනීම

# ගාල්ල මහා නගර සභාව

ගාල්ල මහා නගර සභාවේ පවතින සේවා අවශ්‍යතාවය මත අභ්‍යාසලාභී පෙර පාසල් ගුරු සහායකවරු 10 දෙනෙකු බඳවා ගැනීම සඳහා පහත සුදුසුකම්ලත් අයගෙන් 2017-06-09 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම් :**

- අ.පො.ස. උසස් පෙළ විභාගයේ විෂයන් තුන (03) ක් සමත් වීම.
- අ.පො.ස. සා.පෙළ විභාගයේ ඕනෑම විෂයන් තුනකට සම්මාන සාමාර්ථ සහිතව මව්බස හා ගණිතය ඇතුළුව අවම වශයෙන් විෂයන් 06 ක් සමත් වීම.
- පිළිගත් විශ්වවිද්‍යාලයක/ ආයතනයක පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ උසස් සහතික පත්‍රයක්/ ඩිප්ලෝමාවක් ලබා තිබීම.

**වයස** : අවුරුදු 18 - 35 ත් අතර කාන්තාවක් විය යුතුය. (අයදුම්පත් කැඳවන අවසාන දිනට)

**විශේෂ සුදුසුකම් :**

- පිළිගත් පෙර පාසලක ඉගැන්වීමේ කටයුතු පිළිබඳ අවුරුදු 02 කට නොඅඩු පළපුරුද්ද.
- සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය තුනෙන්ම ඉගැන්වීමේ හැකියාව.

**දීමනාව** : දිනකට රු. 400/-

**සාමාන්‍ය කොන්දේසි :**

මෙම පත්වීම කාර්ය පැවරුම් පදනම මත වසරක කාල සීමාවක් සඳහා වන අතර, වසරක සතුටුදායක සේවා තත්ත්වයක් මත සහ සේවයේ අවශ්‍යතාවය අනුව මෙම පත්වීම දීර්ඝ කිරීම පිළිබඳව සලකා බැලිය හැක.

උප්පැන්න සහතිකය, අධ්‍යාපන සහතික, පදිංචිය පිළිබඳ ග්‍රාම නිලධාරී සහතිකය යන සහතිකවල ඡායා පිටපත් අයදුම්පත්‍රය සමග අමුණා **"නාගරික කොමසාරිස්, මහා නගර සභාව, ගාල්ල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අසම්පූර්ණ හා අපැහැදිලි අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

වැඩිදුර තොරතුරු හා අයදුම්පත්‍රය නාගරික ලේකම් දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

**නාගරික කොමසාරිස්,**
**මහා නගර සභාව, ගාල්ල.**